# කෙටි කතාව

කෙටි කතාව

# නුඹ නැති හින්දා

පොත් පත් සියල්ල බෑගයට දමාගෙන සටහන් ලියූ කොළ කිහිපය ද ෆයිල් කවරයට අසුරා ගෙන හංසි දේශන ශාලාවෙන් පිටතට පැමිණියේ ගීයක පද පේළියක් සිතින් මුමුණමින් ය. පියවර කිහිපයක් ඉදිරියට තබා හිස ඔසවන විට ඔහු සිනාමුසු මුහුණෙන් ඇය ඉදිරියේ සිට ගෙන උන්නේ ය.

".....දැන් ද ලෙක්චර්ස් ඉවර වුණේ.....?" ඔහු අත් ඔරලෝසුවට වරක් නෙත් යොමා ඇසුවේ ය.

".... ම් ....නෑ.... දැන් ටිකක් වෙලා.... පොඩි වැඩ වගයක් තිබුණා...." ඇය කඩිනම් ගමනින් ඉදිරියට යන අතරතුර පිළිතුරු දුන්නා ය...

"..යමු.....අද මාත් ඔයාල ගේ හොස්ටල් එක පැත්තෙ යනවා...." දුලාර ඇය හා පෙළට ගමන් ගත්තේ ය.

"නෑ අයියේ මං දැන්ම යන්නේ නෑ..... තව වැඩ වගයක් තියෙනවා...." හංසි ඉක්මන් අඩි තබා ඔහුව පසුකර වෙනත් දෙසකට හැරුණා ය.

"..එහෙම ද ?...රෑ වෙලා යන්න එපා එහෙනම් තනියම. කෝල් එකක් දෙන්නකෝ මම එන්නම්..." දුලාර ඔහුට පිටුපා යන ඇයට ඇසෙන්නට

හංසිට කළ යුතු වැඩක් නො තිබුණ ද ඇයට අවශ්‍ය වූයේ දුලාර මඟ අරින්නට ය. දැනට දෙවන වසරේ ශිෂ්‍යාවක වූ ඈ පිළිබඳ ව ඇගේ ජ්‍යෙෂ්ඨයෙකු වූ දුලාර උනන්දු වූයේ අද ඊයේක නොව බොහෝ කලකට පෙර සිටන්මය. එහෙත් පාසල් අවධියේ පටන් ගයංග ගේ පෙම්වතිය ව සිටි හංසි ඒ පිළිබඳව උනන්දු නොවී සිටින්නට වග බලා ගත්තා ය. ඔහු ගෙන් ඇයට ලැබුණු රැකවරණය හමුවේ වෙනත් රැකවරණයක්, පිහිටක් අවශ්‍ය වුයේ නැත. විශ්වවිද්‍යාලයට පැමිණීමට පෙරත් ඉන් පසුවත් ගයාන් හංසිගේ වුවමනාකම් පිරිමැසුවේ ද සැබෑ ම සෙනෙහසින් ය. ඇය විශ්ව විද්‍යාල වරම් ලබන්නටත් පෙර පටන්ම රැකියාවක නිරත වූ ගයංග මේ දක්වාම ඇගේ සෙවනැල්ල මෙන් හිඳ අධ්‍යාපන කටයුතු වලට පවා විය පැහැදම් කළේ ය.

වරක් දුලාර හංසිගේ අකමැත්ත පවා නොතකා ඇය පුස්තකාලයටත් ඉන් පසුව ආපනශාලාවටත් පැමිණ ඇය සමඟ කතා කිරීමට උත්සාහ දරමින් උන්නේ ය. ඒ දුටු හංසි ගේ මිතුරියන් ගෙන් බේරිල්ලක් නොවිණ.

"....හංසි ....ඒ පාර උඹ දුලාරයියා එක්ක කොක්කක් ගහන්නද ඔය කල්පනාව....ආ..." පළමුව කෑ ගසන්නට පටන් ගත්තේ මධුමාලි ය.

"....පිස්සුද මධූ....එයා බලෙන් ම ආවා..."

"... බලෙන්?....ඇයි උඹ බබාද ....චී....දුක නැද්ද බං ගයංගට ඔහොම කරන්න....?" ඒ කෞෂල්‍යා ගේ හඬ ය.

වරදක් නො කළ බව මිතුරියන්ට තේරුම් කරවන්නට හංසිට මහත් වෙහෙසක් දරන්නට සිදු විය. තමන්ට විසල් වෘක්ෂයක් මෙන් සෙනෙහසත් රැකවරණයත් නිරතුරුවම ලබා දෙන ගයංගට වරදක් කිරීමට ඇය කිසිවිටෙකත් කල්පනා නො කළා ය.

"...හංසි උඹ පරිස්සමින් ඉන්න එක හොඳයි. දුලාරයියා අමුතුම චරිතයක් අපි නොදන්නව වුණාට දන්න කට්ටිය කියන්නේ....කාලෙන් කාලෙට එක එක කෙල්ලොලු....අනික එයා හොඳින් හරි නරකින් හරි එයාගේ වැඩේ කරගන්න කෙනෙක්ලු..." මධුමාලි කිහිප වතාවක්ම ඇයට අනතුරු ඇඟෙව්වාය.

"..මං මෝඩ නෑ මධූ..."

හංසි එසේ පැවසුව ද කාලයත් සමඟ සියල්ල වෙනස් විය. හංසිත් නො දැනීම දුලාරගේ කතාබහට හැසිරීමට ඇලුම් කරන්නට පටන් ගත්තා ය. ගයංග ගේ නොමැති අලුත් වෙනසක් ඇය දුලාර තුළින් දුටුවා ය. පාසල් යන අවධියේ සුදු ඇඳුමින් සැරසී පැත්තට හිස පීරූ නිරතුරුවම සිනාවකින් මුව සරසාගෙන සිටි ගයංගට නොදෙවෙනි පෞරුෂයක් දුලාරට ද හිමි වී තිබිණි. එහෙත් ඔහු ගේ තැන්පත් ගතිපැවතුම්වලින් අඩක්වත් දුලාර සතු නොවිණි. ක්‍රම ක්‍රමයෙන් හංසි දුලාරත් අතර වූ දැන හැඳුනුම්කම තව දුරටත් වර්ධනය වන්නට විය. බොහෝ විට ඔහු හංසි ව නේවාසිකාගාරයේ ගේට්ටුව අසලට ඇරලවා යන්නට පටන් ගත්තේ ය. ඔවුනොවුන් කතා බහ කරන්නේ ඒ අවසරයෙනි.

"....ඇයි හංසි තාමත් මට අහපුදේට උත්තරයක් නොදෙන්නේ...." දුලාරගේ ප්‍රශ්න හමුවේ ඇය නිරුත්තර වූවා ය.

"....උත්තර නං දැං ඕනෙත් නෑ.... මං දන්නවා ඔයා මට කැමතියි කියලා ඒත් මං ආසයි ඒක ඔයා ගෙන්ම අහගන්න...." ඔහු නැවතත් කීවේ ය. එවිට ඇයට සිහිපත් වූයේ අවසන් වතාවට නිවසට ගොස් ආපසු පැමිණෙන දින බසයට ඇරලූ ගයංග "....පරිස්සමට ඉඳල හොඳට ඉගෙන ගෙන එන්න සුදූ... මට ඔයා ගැන අවිශ්වාසයක් නෑ... යනුවෙන් පවසා හිස අත ගෑ ආකාරයයි.

කෙසේ වෙතත් කාලයා ගේ ඇවෑමෙන් හංසි තෙවන වසර ආරම්භ වන විට ආදරයක හිමිකාරිය වී උන්නා ය. දුලාර ගේ ඇසුර නිරන්තරයෙන් බලාපොරොත්තු වූ ඇය ගයංග ව අමතක කර දමන්නට මහත් වෙහෙසක් දැරුවා ය. එහෙත් යටි සිත ඇයට දොස් නැගූ වාර අනන්ත ය. පෙරදී දෙසතියකට වතාවක්වත් නිවසට යන ඇය සති ගණන් නේවාසිකාගාරයේ රැඳුණා ය. ක්‍රම ක්‍රමයෙන් ගයංගට ලබාදෙන ඇමතුම් සීමා විය. ඔහු ගෙන් ලැබෙන ඇමතුම් පවා නොසලකා හරින්නට ඇය කටයුතු කළා ය.

"....වැඩ වැඩියි ගයංග....ඒකයි ෆෝන් එකට ආන්සර් කරන්න බැරි වුණේ."

ඇගේ නිදහසට කාරණාව එයම විය.

කෙසේ වෙතත් කාලයා ගේ ඇවෑමෙන් හංසි තෙවන වසර ආරම්භ වන විට ආදරයක හිමිකාරිය වී උන්නා ය. දුලාර ගේ ඇසුර නිරන්තරයෙන් බලාපොරොත්තු වූ ඇය ගයංග ව අමතක කර දමන්නට මහත් වෙහෙසක් දැරුවා ය. එහෙත් යටි සිත ඇයට දොස් නැගූ වාර අනන්ත ය. පෙරදී දෙසතියකට වතාවක්වත් නිවසට යන ඇය සති ගණන් නේවාසිකාගාරයේ රැඳුණා ය. ක්‍රම ක්‍රමයෙන් ගයංගට ලබා දෙන ඇමතුම් සීමා විය. ඔහු ගෙන් ලැබෙන ඇමතුම් පවා නො සලකා හරින්නට ඇය කටයුතු කළා ය.
"....වැඩ වැඩියි ගයංග....ඒකයි ෆෝන් එකට ආන්සර් කරන්න බැරි වුණේ ...."
ඇගේ නිදහසට කාරණාව එය ම විය.

ඉවසීම මැනවින් ප්‍රගුණ කළ ගයංග ඒ සියල්ල ඉවසුවේ හංසි හොඳ අධ්‍යාපනයක් ලබනු ඇතැයි සිතමිනි. එහෙත් සිදු වී තිබුණේ වෙනත් දෙයකි.

"...ආ ....මේ ඉන්නේ අලුත් ජෝඩුව කුරුල්ලයි කිරිල්ලියි වගේ....පරිස්සමින් හිටපල්ලා....මල් බකට් එකක් එහෙම ලෑස්තියි...." දුලාර ගේ මිතුරු කැල ඔවුන් දෙදෙනාට විහිළු කළෝ ය.

"...අනේ බකට් කරයි ද දුලාරයියේ..." හංසි ඔහු ගේ අතක වෙළී ඇසුවා ය.
....බකට් කළොත් බකට් වෙමු... මහ ලොකු දෙයක් යැ ඕක..." ඔහු සිනහවෙමින් පිළිතුරු දුන්නේ ය.

හංසි ගේ අලුත් සම්බන්ධය පිළිබඳ ව ඇගේ මිතුරියන් දැක් වූ ආකල්පය එතරම් සුබදායක නොවිණි. පියා අහිමි හංසි පිළිබඳ ව නිතර සොයා බලමින්, රැකවරණය සපයමින් සිටි ගයංගට පිටුපා දුලාර සමඟ ඇරඹි සම්බන්ධයට ඔවුන් එක හෙළා ම විරුද්ධ වූහ.

එසේ හෙයින් ඒ මුල් දිනවල ඇය නේවාසිකාගාරයට ගියේ බොහෝ ප්‍රමාද වීමෙන් පසුව ය.

"....හොඳ දෙයක් නෙමෙයි හංසි උඹ ඔය කර ගත්තේ..."

"...ඒක නේ කීවේ අපි දූලාර ගැන....හොඳ කොල්ලෙක් නම් කමක් නෑ තව.." ඒ කෞශල්‍යා ය.

"..අයියෝ කෞ...බබෙක් ද බං මං .... බණ කියන්න එපා මට....උඹලට විකාර..."

"....පොඩි ළමයින්ට තියා ලොකු මිනිස්සුන්ටවත් බේරිලා ඉන්න පුළුවන් සමාජයක් නෙමෙයි මෝඩියේ මේක... ඒකයි කිව්වේ......කැමති විදියක්......යාළුකම හින්දා තියෙන කැක්කුමටයි කිව්වේ..."

මිතුරියන් ගේ බස් නො ඇසූ ඇය රිසි පරිදි දූලාර ඇසුරු කළා ය. නිවසට නොගොස් සති අන්තයේ නේවාසිකාගාරයේ රැඳෙන දිනෙක ඇය ඔහු ගේ කීමට කොහේ හෝ ඇවිදින්නට ගියා ය. දූලාර ගේ දඟකාර නෙත්වල පහස නිරතුරුව ලබන්නට ඇය ආශා කළා ය. ඒ දවස ගයංග ගේ ආදරයෙන් පිරී තිබුණු සිත දැන් මුලුමනින්ම පිරී ඇත්තේ දූලාර ය.

මාස එක හමාරකින් පමණ ගෙදර යන හංසි ව හමුවන්නට ගයංග පැමිණිය ද ඇය ඔහුව මඟහැර ඉන්නට උත්සාහ කළා ය. යමක් ඉවෙන් මෙන් තේරුම් ගෙන සිටි ගයංග "....ඔයාට හොඳ විදියක් හංසි... ඔයා දැන් උගත් කෙනෙක් නේ....ඒ තත්ත්වෙට ගැළපෙන කෙනෙක් ඔයාට ඉන්න එක හොඳයි.... මං නිසා ගෙදර නෑවිත් ඉන්න එපා....ඔයා ගේ අම්මලා බලල යන්න ඇවිත්..."

හංසි ගයංග ගේ ඉවසීම හමුවේ නිරුත්තර වූවා ය. එය ඇයට තදබල ලෙස දැනුණු කම්මුල් පහරක් හා සමාන ය. දෙනෙතට නැඟුණු කඳුළු අසීරුවෙන් වළකා ගත් ඇය පසුගිය සිදුවීම් එකිනෙක මෙනෙහි කළා ය. තමන් බරපතළ වරදක් කළා වැනි හැඟීමක් ඇගේ හදවතට වේදනා ගෙන දෙන්නට විය. ඇය දින කිහිපයක් ම අරමුණකින් තොර ව නිවසේ ගත කළා ය. දූලාර ඇගේ නො පැමිණීමට හේතු සෙව්වේ ය.

"...ඇයි ලෙක්චර්ස් කට් කරන්නේ....ගෙදර ඉඳන් මොනවා කරනවා ද හංසී.....මොකද ගමේ කොල්ල යන්න එපාලු ද?..."

"....හෙට අනිද්දට මං එනවා දූලාරයියේ ...." ඇය කෙටි පිළිතුරු ලබා දුන්නා ය.

හංසි පෙර මෙන් උනන්දුවෙන් අධ්‍යාපන කටයුතුවල නිරත නො වූ අතර විටෙක දේශන ද මඟ හැරියා ය. වරදක් කළ අයකු දඬුවම බලාපොරොත්තු වන්නේ යම් සේද ඇය ගයංග ගෙන් දඬුවමක් බලාපොරොත්තු වූවා ය. දූලාර ඒ පිළිබඳ ව විමසන විට ද ඇය මුණිවත රැක්කා ය.

කලබලකාරයකු වූ දූලාර කල්ගතවෙත් ම හංසි ගේ සුළු සුළු අතපසුවීම් වලට පවා කේන්ති ගන්නට ගත්තේ ය. පෙර පැවැති ළෙන්ගතු බවත් ආදරයත් කෙමෙන් අඩුවන බවක් හංසිට දැනිණි. එහෙත් ඇය මුවින් නො බැන සිටියා ය.

"....ඇයි දූලාරයියේ ඔයා දැං වැඩිය මාව හම්බවෙන්නවත් කතා කරන්නවත් එන්නේ නැත්තේ....." ඉවසීම අවම වූ තැනකදී ඇය කඳුළු පිරී දෑසින් විමසුවා ය.

".....පිස්සු ද ?එහෙම එකක් නෑ....ඔයා වැඩ ටික කර ගන්නකෝ මටත් මේ ටිකේ සෑහෙන වැඩ නේ....ඔයා නො දන්නවා නෙමෙයි නේ...." ඒ ඔහු ගේ පිළිතුරයි. ■



හංසි දුලාර ගේ වෙනස්කම් අසීරුවෙන් විඳ දරාගෙන උන්නා ය. තමන් ගයංග ට කළ වරදට තමන්ට ද මෙලෙස දඬුවම් ලැබෙන බව සිතට පහදා දෙන්නට උත්සාහ කළා ය. වැඩිකල් නො ගොස්ම දුලාර කෙමෙන් කෙමෙන් හංසිගෙන් ඈත් වී වෙනත් හදවතකට ලංවෙන්නට පටන් ගෙන තිබිණි. එය කණ වැකුණු සැණින් ඇය මිතුරියට දුක කියමින් හඬා වැටුණා ය. ඉකිගසා හැඩීමෙන් රතු වූ දෑස් මත බොහෝ විට කඳුළක් බොඳ වී තිබිණි. අඬා දොඩා පලක් නොවන බව කියමින් මිතුරියෝ ඇය ව අස්වසන්නටත් ඇය සමඟ දුක බෙදා ගන්නටත් ඉදිරිපත් වූහ. එය ඇයට තිබූ එකම අස්වැසිල්ල විය.

"....දන්නවාද වැඩේ .....දුලාර ජයග්‍රාහී හතරවෙනි කොක්කත් ගහල සුපර් ජූනියර් බැජ් එකෙන්...." ඒ පිළිබඳ ව විස්තර ගෙනාවේ කෞෂල්‍යා ය.

දුලාර ගේ සෙවීම් බැලීම්, ඇමතුම්, හමුවීම්, සියල්ල නැවතී තිබිණි. තමන්ට අවංක ව ආදරය කළ පියෙකු මෙන් රැකවරණය සැලසූ ගයංග ගේ පිවිතුරු ආදරයට පයින් ගැසූ වරදට තමන්ට මේ ලැබුණු දඬුවම මදියැයි ඇගේ සිත ඇයටම දොස් නැඟුවේ ය. හැකි විගසින් දුවගොස් ගයංග ගේ පාමුල වැඳ වැටී සියල්ල ඔහු හා පවසා හිත නිදහස් කරගන්නට බලවත් වුවමනාවක් ඇති විය. හැරමිටි වාරුවෙන් හෝ නැගිටුවා ලන්නට නොහැකි සේ ඔත්පළව තිබූ ඇගේ ආදරය සියලු සිහින බිඳ දමා තිබිණි.

"...ඒක නේ ....හොඳට ගොඩ දාගන්න හංසි එග්සෑම්..."

"....ඔයාට බැරිකමක් නෑනේ...." අවසානයට හංසිට ඉතුරු වූයේ දුක සැප දෙක බෙදා ගත් බත්පත එකට කෑ මිතුරියන් පමණි.

කඳුළු පටල බොඳ වූ දෑසින් ඈ නේවාසිකාගාරයේ ජනෙල් රාමුවෙන් එපිට බලා ගෙන සිත ධෛර්යයමත් කර ගන්නට අධිෂ්ඨාන කර ගත්තා ය. ඒත් සමඟම විශ්වවිද්‍යාලයට පැමිණි මුල් අවධියේ දිනෙක ගයංග ගෙන් ලැබුණු කෙටි පණිවිඩයක් ඇයට සිහිපත් විය. එය ප්‍රසිද්ධ ගීතයක පදවැලකි.

"ශිල්ප සොඳින් ලැබ ගන්න ගිහිං නුඹ
යහතින් දෝ කොලොම්පුරේ
ඉන්න නොවේ මියැදෙන්න හිතයි මට
නුඹ නැති හන්දා මං තනියේ....." ■

**බුද්ධි ප්‍රමෝදා**

## WHO CAN NAME IT?

It is beyond the friendship
But
It is love neither friendship
Carving makes smile
But
It is not a smile for love
Departure makes tears
But
It is not a tear for love
Between friendship and love,
What is this cute, rare
relationship?
Who can name it?

G. M. T. S. Ranathunga